## 1.1 හැඳින්වීම

අද්‍යතන ජනමාධ්‍ය හා මානව ජීවිත අතර පවතින සබඳතාව ඉතා සමීපවූ ද, ගැඹුරුවූ ද, මතභේදාත්මකවූ ද ස්වරූපයකින් යුක්තය. සන්නිවේදන තාක්‍ෂණයේ දියුණුවත් සමඟ මානව සමාජයට සම්ප්‍රාප්ත වන විවිධ හැඩයෙන් යුත් ජනමාධ්‍ය අංගයන් හේතුවෙන් එතෙක් පැවැති සම්ප්‍රදායික සමාජය විවිධාකාර අයුරින් වෙනස්වන්නට විය. මේ නිසාම නූතන ජනමාධ්‍ය, මිනිසාගේ ජීවන කතිකාවත් ගැඹුරු ලෙස වෙනසකට භාජනය කිරීමට සමත් පෙරළිකාරයෙකු බවට පත්ව ඇත.

ලෝකයේ ප්‍රචලිත ජනමාධ්‍ය අතරින්, වර්තමානයේ වඩාත් අවධානය යොමුව පවතින්නේ රූපවාහිනී මාධ්‍යය කෙරෙහිය. ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රබලතාවය තුළින් ප්‍රේක්‍ෂකයා හමුවට පැමිණෙන රූපවාහිනිය, මිනිසාගේ සමාජීය ජීවිතය මෙන්ම පෞද්ගලික ජීවිතය කෙරෙහි ද, දැඩි බලපෑමක් ඇති කරමින් ජනමාධ්‍ය ක්‍ෂේත්‍රය තුළ ප්‍රමුඛයා බවට පත්ව තිබේ. රූපවාහිනියට ආවේණික සුවිශේෂී හැකියාවන් ඉතා සූක්‍ෂම ලෙස ප්‍රයෝජනයට ගනිමින් ප්‍රේක්‍ෂකයා වෙත පැමිණෙන රූපවාහිනී මාධ්‍යය, මානව ජීවිතයේ තීරණාත්මක සාධකයක් බවට පත්ව ඇත්තේ එයට ඇති අසීමිත ජන ආකර්ෂණය හේතුවෙනි.

"සමකාලීන ලෝකය තුළ රූපවාහිනිය මිනිසුන්ගේ පුරුෂාර්ථ, හර පද්ධති, ආචාර ධර්ම, සිතීමේ ශෛලිය, සදාචාරය, චර්යා පද්ධති, බුද්ධිය ආදී මානව සමාජ ජීවිතයේ මූලික සංරචකයන් කෙරෙහි බලපානවා පමණක් නොව, ඒවා මත සිය පාලනමය ආධිපත්‍යය ද, පවත්වාගෙන යමින් සමාජයේ සමස්ත සංස්කෘතික හා අධ්‍යාත්මික ජීවිතය හසුරුවන්නේය." (වීරසිංහ,2007:පෙරවදන)

රූපවාහිනී මාධ්‍යය ශ්‍රී ලාංකේය සමාජයට පැමිණ ගෙවී ගිය වසර 30 ක පමණ වූ, ගමන් මඟෙහි පිය සටහන් පරීක්‍ෂා කිරීමේදී, එය අපගේ ජන ජීවිතයට කර ඇති බලපෑම අති විශාල බව පෙනේ. එය සමාජයේ සෑම සියලු දෙනාගේම ජීවිතයට බද්ධ වූ ඔවුන්ගේ ජීවන රටාව හසුරුවන, ප්‍රබල මතවාදී යාන්ත්‍රණයක් බවට පත්ව ඇත. 1982 - අංක 6 දරණ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත මඟින්, රූපවාහිනියේ හැසිරීම රටාව කෙබඳු විය

යුතුද? එය සමාජයේ යහපැවැත්ම උදෙසා දායක විය යුත්තේ කෙසේද? යන්න පිළිබඳව පැහැදිලිව පෙන්වා දී ඇත. එහෙත් අද වන විට එම පනතින් අපේක්ෂා කළ අරමුණු ඉටුවේද යන්න ගැටළු සහගතය.

රූපවාහිනියේ විවිධාකාර වැඩසටහන් අතරින්, ජනප්‍රියම වැඩසටහන් ආකෘතිය බවට පත්ව ඇත්තේ ටෙලි නාට්‍යයි. 1940 දශකයේ ඇමෙරිකාවේ බිහිවී වර්ධනය වූ මෙම ප්‍රවණතාවය, අද්‍යතනය වන විට සමාජ බලපෑම් ද සහිතව ව්‍යාප්ත වන ස්වරූපයක් දක්නට ලැබේ. ටෙලි නාට්‍ය, ලාංකේය ප්‍රේක්ෂකයා කෙතෙක් මානසික ග්‍රහණයට නතු කළේ ද, යත් එතෙක් නිවසින් පිටතට ගොස් කලා අංග රසවිඳීමට පුරුදුව සිටි ජනයා නිවසෙහි රඳවා තබා ගැනීමට තරම් ශක්තිමත් විය. කතා තේමාව, විකාශනය වන කොටස් ගණන, ධාවන කාලය, ආකෘතිය හා නිර්මාණයේ අන්තර්ගතය අනුව ඒකාංගික, ප්‍රසාංගික, කතාංග, අර්ධ වෘත්තාන්ත ආදී වශයෙන් විවිධාකාර නම් වලින් හඳුන්වන ටෙලි නාට්‍ය ආකෘති අද්‍යතනයේ බහුල වශයෙන් දක්නට ලැබේ. මේ නිසාම ලොව පුරා විශාල වශයෙන් ටෙලි නාට්‍ය නිර්මාණය වන අතර, ඒ සඳහා අතිවිශාල ප්‍රේක්ෂක ඉල්ලුමක් ද පවතී.

රූපවාහිනී මාධ්‍යය මෙරටට හඳුන්වා දුන් මුල් අවධියේදී සතියකට විකාශනය වූයේ ටෙලි නාට්‍ය 3 -5 අතර ප්‍රමාණයක් වුවත්, අද වන විට එක් නාලිකාවක් දිනකදී ටෙලි නාට්‍ය පහක් පමණ විකාශනය කිරීමට පෙළඹීම තුළින් පැහැදිලි වන්නේ, ඒ කෙරෙහි පවතින්නා වූ ඉහළ ප්‍රේක්ෂක සහභාගීත්වයයි.

ලාංකේය ටෙලි නාට්‍ය කලාව දෙස බලන විට පෙනී යන්නේ, දේශීය ටෙලි නාට්‍ය මෙන්ම විදේශීය ටෙලි නාට්‍යයන් ද, සුවිශේෂ ස්ථානයක් හිමිකරගෙන ඇති බවයි. මෙම කරුණ තවදුරටත් තහවුරු වන්නේ, සෑම දිනකදීම කුමන හෝ දේශීය රූපවාහිනී නාලිකාවක විදේශීය ටෙලි නාට්‍ය එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකාශනය වීම නිසාය. 20 වන සියවස අග භාගය වන විට ඉතා ප්‍රබල අයුරින් විදේශීය ටෙලි නාට්‍ය ලාංකේය සමාජය තුළ ස්ථාපිත වන්නට විය. මෙහිදී, රූපවාහිනී ආයතන විසින් විවිධ රටවල නිපදවන ලද ටෙලි නාට්‍ය ආනයනය කිරීමත්, තරඟකාරීත්වයකින් යුතුව ඉදිරිපත් කිරීමත්, සිදුකරන ලදී. මේ සෑම ටෙලි නාට්‍යයක්ම විකාශනය කරන ලද්දේ, ප්‍රේක්ෂකයාට වඩාත් සමීප වන

ආකාරයට සිංහලට හඬකැවීමෙන් හෝ උපසිරැසි යෙදීම මගිනි. මේ නිසාම ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකයාගේ ජීවිත කෙරෙහි සියුම් ලෙස බලපෑම් ඇති කරන සාධකයක් බවට විදේශීය ටෙලි නාට්‍ය පත්විය.

"පොදුවේ ගත් කළ ඇතැම් ස්වදේශික පවුල් ජීවිතවලට ඇතැම් ටෙලි නාට්‍ය තර්ජනයක් වී ඇත. මාතෘත්වය, දාරක සුභ සිද්ධිය, පවුලේ පැවැත්ම යන සාධකවලට මේවායින් එල්ලවන්නේ අභියෝගයන්ය" (මහේන්ද්‍ර,2007:65)

රූපවාහිනී විකාශනයේ රන් කාලය (Prime Time) තුළ විකාශනය වන ටෙලි නාට්‍ය නරඹන ප්‍රතිශතය නරඹන්නන්ගේ 70% - 90% ත් අතර ප්‍රමාණයක් වේ. ඒ අනුව පෙනී යන්නේ, ලාංකේය ජනතාවගෙන් බහුතර පිරිසක් ටෙලි නාට්‍ය නැරඹීම සිදු කරන බවයි. මේ නිසා ටෙලි නාට්‍යයන්හි අන්තර්ගතය මගින් සිදුවන බලපෑම සමස්ත මානව සමාජයේ හැඩ ගැස්වීම තීරණය කිරීමට ද, හේතුවිය හැකිය. ඒ අතරින් රූපවාහිනී නාලිකා තුළ විදේශීය ටෙලි නාට්‍ය වැඩි වශයෙන් විකාශනය වීම නිසා, එයින් බලපෑම් ඇති වීම අනිවාර්ය අංගයක් බවට පත්ව ඇත.

විදේශීය ටෙලි නාට්‍යයේ බලපෑම පිළිබඳ විවිධ විචාරකයන් විවිධාකාර මත පළකර තිබුණත්, ඉන් ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකයාගේ ජීවන කතිකාවන්ට කර ඇති බලපෑම පිළිබඳ ගැඹුරු කතිකාවතක් තවම ගොඩනැගී නොමැත. මේ නිසාම විදේශීය ටෙලි නාට්‍ය මගින් සිදුවන බලපෑම පිළිබඳ පැහැදිලි අවබෝධයක් හෝ දැනුමක් ලාංකේය බහුතර ප්‍රේක්ෂක ජනතාව සතු නොවේ. එම නිසා රූපවාහිනියේ පෙන්වන ඕනෑම දෙයක් තමාගේ කරගෙන නැරඹීමට තරම් ලාංකිකයන් පෙළඹී ඇති අතර, ඒ හේතුවෙන් විදේශීය ටෙලි නාට්‍යයන්හි බලපෑමට විශාල වශයෙන් ගොදුරු වීම සිදුවේ. එබැවින් මෙම පර්යේෂණ නිබන්ධනය තුළින් මා ඉදිරිපත් කිරීමට උත්සාහ දරනුයේ, විදේශීය ටෙලි නාට්‍ය ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකයාගේ ජීවන කතිකාවන්ට කර ඇති බලපෑම පිළිබඳ සොයා බලා කරුණු ඉදිරිපත් කිරීමය. එහිදී විදේශීය ටෙලි නාට්‍යයේ බලපෑමට ලාංකේය ප්‍රේක්ෂකයා නතුවන ආකාරය, ඒ තුළින් ජීවිතය වෙනස්කර ගන්නා ආකාරයත්, හැසිරීම් රටාව හා පුද්ගල සම්බන්ධතා කෙරෙහි බලපාන